# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14
2017 අප්‍රේල් - ජූනි
මානවශාස්ත්‍ර පීඨය

**බෞද්ධ සංස්කෘතිය - BUCU – E 2015**

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා**

කොටස් දෙකෙන්ම ඇතුලත් වන පරිදි ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

### පළමු කොටස

01. දකුණු ආසියාවේ බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පයේ සමාරම්භය ගෙනහැර දක්වා එහි භාරතීය විකාශය පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් සපයන්න.

02. බුද්ධ ප්‍රතිමාවේ ඓතිහාසිකත්වය පැහැදිලි කොට ගන්ධාර හා මථුරා සම්ප්‍රදායාගත බුද්ධ ප්‍රතිමා කලාවන් හි සමවිෂමතා පරීක්ෂා කරන්න.

03.. ශ්‍රී ලාංකේය පැරණි ආගමික ගොඩනැගිලි දොරටු හා සම්බන්ධ කලා කෘති පිළිබඳ සාරාංශයක් දක්වා සඳකඩපහණෙහි අපූර්වත්වය විද්වත්මත ඇසුරින් සාකච්ඡා කරන්න.

04. බෞද්ධ ස්තූප කලාවේ ඓතිහාසිකත්වය පැහැදිලි කොට ලක්දිව ස්තූප කලාව හා එහි ප්‍රභේද පිළිබඳ කරුණු සවිස්තරාත්මකව දක්වන්න.

05. මෙරට බෞද්ධ චිත්‍ර සම්ප්‍රදායේ විවිධ යුග හඳුන්වා මහනුවර චිත්‍ර කලාවේ සුවිශේෂත්වය නිදසුන් මඟින් පෙන්වා දෙන්න.

### දෙවන කොටස

06. බෞද්ධ භික්ෂු සමාජයේ සමාරම්භය හා විකාශය ක්‍රමිකව සිදු වූ ආකාරය මූලාශ්‍රයාගත තොරතුරු ඇසුරින් සාකච්ඡා කරන්න.

07. චුල්ලවග්ග පාලි භික්ඛුණී ඛන්ධකයේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් භික්ෂුණී සමාජයේ ආරම්භය පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් ගෙන හැර දක්වන්න.

08. පැවිද්ද හා උපසම්පදාව අතර පවත්නා වෙනස හා සුවිශේෂත්වය මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රකට කරන්න.

09. බුද්ධ කාලීන ප්‍රකට ශ්‍රාවක ශ්‍රාවිකා චරිතාපදානයන්ගෙන් පුද්ගල චරිත සංවර්ධනය සඳහා ගත හැකි පරමාදර්ශ නිදසුන් ඇසුරින් ප්‍රකට කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකකට (02) ප්‍රමාණවත් විස්තර සපයන්න.

1. බෞද්ධ ආරාම පරිපාලනය හා කළමනාකරණය
2. අෂ්ඨගරුධර්ම හා භික්ෂුණී සමාජය
3. බෝධිඝර
4. ලක්දිව බෝධිසත්ව ප්‍රතිමා

**********************